# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ආංශික අධීක්ෂණ කාරක සභාවලට සහාය වීම පිණිස යොවුන් නියෝජිතයන් තෝරා ගැනීම

පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහභාගීත්වයෙන් පහත සඳහන් විෂයයන් ආවරණය කරමින් ආංශික අධීක්ෂණ කාරක සභා දහහතක් ස්ථාපනය කිරීම පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත.

01. ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
02. ප්‍රතිසංධානය සහ ජාතික සමගිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
03. ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
04. ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
05. ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
06. භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
07. ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
08. බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
09. ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
10. පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
11. අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
12. විදෙස් රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
13. යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
14. සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
15. ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
16. මාධ්‍ය, තාරුණ්‍යය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
17. විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

පාර්ලිමේන්තුව විසින් 2022.10.05 දින සම්මත කරන ලද සංශෝධිත ස්ථාවර නියෝගවල විධිවිධාන පරිදි මෙම කාරක සභා විසින් මෙහෙයවනු ලබන විමසීම් සම්බන්ධයෙන් කාරක සභාවලට සහාය වීම සඳහා කාරක සභාවක සභාපතිවරයාට තරුණ නියෝජිතයන් පස් දෙනෙකු බැගින් කැඳවිය හැකි බැවින් පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද ලබාගෙන ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2023 ජනවාරි 09 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා තරුණ නියෝජිතයන් තෝරා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. (මෙම තොරතුරු **www.parliament.lk** වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකිය.)

**01. වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

**02. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

පහත සඳහන් (අ) සහ (ආ) යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද ලබාගෙන ඇති අයදුම්කරුවන්ට ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා තරුණ නියෝජිතයන් ලෙස තෝරා ගනු ලැබීමට අයදුම්කළ හැකිය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම **හෝ**

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම

අයදුම්කරුවන්ට ඉහත දක්වා ඇති කාරක සභා විෂයයන් පිළිබඳ ප්‍රාමාණික දැනුම/වෘත්තිමය පළපුරුද්ද/ නිපුණතාව තිබිය යුතුය.

**03. තෝරා ගැනීමේ ක්‍රමවේදය**

අයදුම්කරුවන් විසින් එවනු ලබන අයදුම්පත්‍රවල ඇති සුදුසුකම් හා විෂයයන් පිළිබඳව දක්වන ප්‍රවීණත්වය අනුව එක් එක් කාරක සභාවේ කටයුතු සඳහා ඒ ඒ අවස්ථාවේ සේවය කිරීම සඳහා සුදුසු තරුණ නියෝජිතයන් තෝරා ගනු ලැබේ.

04. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) ජාතික හැඳුනුම්පතේ පිටපතක්

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඈ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඉ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

05. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි සොයා ගනු ලැබුවහොත්, අයදුම්කරු නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට හේතු වනු ඇත.

06. ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන අයදුම්පත්ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**
**2022 දෙසැම්බර් මස 18 වැනි දින.**